# පාලි භාෂාවේ ක්‍රියා රූප කෙරෙහි සංස්කෘත බලපෑම

ආචාර්ය ඩබ්. ඇම්. දේශප්‍රිය ගුණසේ

## ප්‍රවේශය

පාලි, සංස්කෘත භාෂාවන්හි ක්‍රියා රූපය නියෝජනය කෙරෙන පද 'ආඛ්‍යාත' යැයි ද සිංහලයෙහි 'ක්‍රියාපද' යැයි ද හඳුන්වනු ලැබේ. නාම - ආඛ්‍යාත යනු පෙරදිග ඕනෑම භාෂාවක සිව් වැදෑරුම් පද ප්‍රභේද අතර ප්‍රධාන කොටස් දෙකකි. ඉන් ආඛ්‍යාත පද යනු කර්තෘගේ ක්‍රියාර්ථය සාධනය කෙරෙන පද විශේෂය යි. පාලි, සංස්කෘත, සිංහල භාෂාවන්හි ක්‍රියා රූපය නියෝජනය වන්නේ ආඛ්‍යාතය තුළ යි. ආඛ්‍යාතයේ ප්‍රධාන අංගයක් ලෙස ක්‍රියා මූලය හෙවත් ධාතුව සැලකේ. සංස්කෘත භාෂාව පෝෂණය වී ඇත්තේ ධාතූන් කෙරෙනි. පාලිය ද ධාතු මූලික ව පෝෂණය වූ භාෂාවකි. එබැවින් මේ භාෂාවන් ධාතු මූලික භාෂා යැයි සැලකේ. යම්කිසි භාෂාවක ආඛ්‍යාතය දියුණුවට පත්වී තිබේ නම් එය දියුණු භාෂාවකි. මේ අනුව පාලි, සංස්කෘත භාෂා පද බාහුල්‍යයෙන් පෝෂිත දියුණු භාෂා ලෙස සැලකේ.

ආඛ්‍යාතය වූ කලී පාලි භාෂාවෙහිත්, සංස්කෘත භාෂාවෙහිත් සංවර්ධනය වූ ව්‍යාකරණ සිද්ධාන්තය කි. ඉන්දු ආර්ය භාෂා ගණයෙහි මධ්‍යතන යුගය නියෝජනය කෙරෙන පාලිභාෂාවේ ව්‍යාකරණය සංස්කෘත ව්‍යාකරණයෙන් පෝෂණය වී තිබේ. **පාණිනී අෂ්ටාධ්‍යායී** ව්‍යාකරණයේ බලපෑම, ක්‍රි. ව. 07 වැනි සියවස පමණ රචිත යැයි සැලකෙන පාලි **කච්චායන ව්‍යාකරණය** කෙරෙහි ඇති වී තිබේ. පාලි ව්‍යාකරණ සිද්ධාන්ත නම් කිරීමේ දී හා සිද්ධාන්ත ගොඩනැගීමේ දී සංස්කෘතයේ බලපෑම බෙහෙවින් බලපා තිබේ.

---

© ආචාර්ය ඩබ්. ඇම්. දේශප්‍රිය ගුණසේන හිමි

සංස්කාරකවරු :- රාජකීය පණ්ඩිත මහඇල්ලැද්දේ සිලානන්ද හිමි, රාජකීය පණ්ඩිත පැඹිගිරියේ ඉන්දවිමල හිමි
සහාය සංස්කාරකවරු :- කුඩාගල විජිතවංශ හිමි, දැනමිගම ධම්මාලෝක හිමි
'නැණපස' - වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය - අස්ගිරි මහාවිහාර මහා පිරිවෙන් ප්‍රකාශනයකි. පිටු - 194 - 206

කච්චායන ව්‍යාකරණයෙහි එන *පරසමඤ්ඤා පයෝගෙ* (9-11) සංඥා සූත්‍රයට අනුව සංස්කෘතා දී අන්‍ය ව්‍යාකරණයන්ගේ සංඥාවන් ගතයුතු බව පෙනේ. ප්‍රස්තුතය කෙරෙහි සංස්කෘත භාෂාවේ බලපෑම් කවරේදැයි විමර්ශනය කිරීම මෙහිලා අභිප්‍රාය වේ.

## පාලි ක්‍රියාරූප සාධනය

පාලියෙහි ක්‍රියාරූප සාධනයෙහි අත්‍යාවශ්‍ය අංග නවයක් හඳුනා ගැනේ. එනම්, ධාතු, ගණ, විකරණ, විභක්ති, කාරක, කාල, පුරුෂ, පද හා වචන යනු යි. මෙහි දැක් වූ ප්‍රභේද නවයෙහිම සංඥා නාමයන් සංස්කෘත ව්‍යාකරණයට අනුගතව දක්වා තිබේ. එසේ ම අන්තර්ගත කරුණු ද සංස්කෘත ව්‍යාකරණයට අනුව ම විමර්ශනය කළ හැකිය.

ක්‍රියා ලක්‍ෂණ පෙන්නුම් කෙරෙන බැවින් ආඛ්‍යාතය යැයි කියනු ලැබේ. කාලකාරක පුරිස යන මේවා ක්‍රියා ලක්‍ෂණයෝ ය. අතීත, වර්තමාන හා අනාගත යැයි පාලියෙහි කාල තුනකි. සංස්කෘතයේ ද අතීත, වර්තමාන හා අනාගත යැයි තුන් කාලයට ම ගැනේ. කම්මකාරක, කත්තෘකාරක හා භාවකාරක යැයි පාලියෙහි කාරක තුනකි. සංස්කෘතයෙහි ද එසේම ය. පාලියෙහි පඨම, මජ්ඣිම හා උත්තම යැයි පුරිස තුනකි. සංස්කෘතයෙහි ද එසේම ය. ගමු - ගමෙන, පච - පාකෙ ආදි ධාතූන්ගේ අර්ථය ක්‍රියා නම් වේ. එය කාල, කාරක, පුරිස මගින් පෙළි වේ.

ධාත්වර්ථය කාලාදී වශයෙන් බෙදා දක්වන බැවින් විභක්ති නම් වේ. ධාත්වර්ථය බෙදා දක්වන ප්‍රත්‍යය 'ති' අන්ති ආදීහු ය. මොවුහු වර්තමාන, පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, කාලාතිපත්ති හා භවිස්සන්ති යැයි අට වැදෑරුම් වේ.